# පැදි හදිය

## අම්මේ....

අම්මේ ඔබේ මුදු ඔවදන් ඇසෙනවනම්
සත් සමුදුර උවත් තරණය කොට එන්නම්
ඔබ ගුලි කරන බත් පිඬු එක එක කන්නම්
ඔබේ උකුල මත හිසලා සැනසෙන්නම්

අම්මා කියූ මුල් වදනේ අරුත දැනී
දෙනුවන් තෙමෙයි දැන් ඉද හිට මට නොදැනී
මා හැර ගියේ ඇතුවද හද පතුලෙ ගිනී
මෙතේ බුදුන් දින හෝ හමුවෙමු තුටිනී

රාහුලයෙක් කියා බැඳ පෙම ඉවත් කොට
සිදුහත් කුමරු තම පුතු හැර ගිය ලෙසට
ඔබ ගියෙ සොයන්නද දෙසූ මග බුදු බණට
සීනෙන් හෝ ඇවිත් සලසනු මැන සතුට

*මහාචාර්ය ෂෙල්ටන් පීරිස්*
*සිඩ්නි*

The SINHALA, NOV 2017 (ISSN 1834-7061) P17